සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025 / Second Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	ගණිතය - I	කාලය / நேரம் / Time	පැය 2 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**
- **A කොටසෙහි සියලුම ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ද, B කොටසෙහි එක් ප්‍රශ්නයක නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 10 බැගින් ද හිමිවේ.**

A කොටස

01. මිනිසුන් 6 දෙනෙකුට දින 7 ක දී නිමකළ හැකි වැඩක් දින 3 දී නිමකිරීමට දිනකට යෙදවිය යුතු මිනිසුන් ගණන සොයන්න.

02. හිස්තැන් පුරවන්න. $(2x+3)^2 = \ldots\ldots\ldots + 12x + \ldots\ldots\ldots$

03. රූපයේ දී ඇති තොරතුරු අනුව x හි අගය සොයන්න.



04. මිනිත්තුවට ලීටර් 120 ක ශීඝ්‍රතාවයකින් ජලය සපයන නළයකට ටැංකියකින් හරි අඩක් පිරවීමට මිනිත්තු 5 ක් ගතවේ. ටැංකියේ ධාරිතාව සොයන්න.

05. x හි අගය සොයන්න.



06. විසඳන්න. $\frac{1}{x} + \frac{1}{2x} = \frac{1}{4}$

07. $\log_6 216 = 3$ නම් 216, 6 හි බලයක් ලෙස ලියන්න.

---

08. වෙන්රූප සටහනේ $A \cap B'$ පෙදෙස අඳුරු කරන්න.



---

09. $2, 5, x, 4, 8$ යන සංඛ්‍යා සමූහයේ මධ්‍යන්‍යය 5 නම් x හි අගය සොයන්න.

---

10. $4a^2b, 2b^3c$ යන පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

---

11. රූපයේ AB හා CD සරල රේඛා O හි දී ඡේදනය වෙයි. AO = OB නම් AOC Δ හා BOD Δ ය (පා.කෝ.පා.) අවස්ථාව යටතේ අංගසම කිරීමට සමාන විය යුතු ඉතිරි පාද යුගලය නම් කරන්න.



---

12. 4% මාසික සුළු පොළියට රුපියල් 20 000 ක් ණයට ගත් සමන්ට මාසයක් අවසානයේ ණයෙන් නිදහස් වීමට ගෙවිය යුතු මුදල සොයන්න.

---

13. රූපයේ දී ඇති තොරතුරු අනුව AB සරල රේඛාවේ සමීකරණය ලියන්න.



14. පහත වගුවේ දී ඇති තොරතුරු භාවිතයෙන් $\sqrt{73}$ හි අගය සොයන්න.

x	8.4	8.5	8.6	8.7
x^2	70.56	72.25	73.96	75.69

15. විසඳන්න. $(x-4)(x+1)=0$

16. රූපයේ $AD = DB = BC$ වෙයි. $D\hat{B}C = 40^0$ නම් $B\hat{A}D$ සොයන්න.



17. $2x^2 + 3x - 5$ ත්‍රිපද වර්ගජ ප්‍රකාශනයේ එක් සාධකයක් $(x-1)$ නම් ඉතිරි සාධකය සොයන්න.

18. $ABCD$ සමාන්තරාස්‍රයේ D සිට AB ට ඇඳි ලම්බය DX වෙයි.
$A\hat{D}X$ හි අගය සොයන්න.



19. භාජනයක හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන නිල්පාට හා රතුපාට පබළු 30 ක් ඇත. භාජනයෙන් අහඹු ලෙස ගත් පබළුවක් නිල්පාට වීමේ සම්භාවිතාව $\frac{3}{5}$ නම් එහි ඇති නිල්පාට පබළු ගණන සොයන්න.

20. අරය 7 cm වන වෘත්තයක පරිධිය 44 cm කි.
රූපයේ දී ඇති මිනුම් අනුව අඳුරු කළ කොටසේ පරිමිතිය සොයන්න.



---

21. මිනිසෙකුට ඒකාකාර වේගයෙන් තම යතුරු පැදියෙන් නිවසේ සිට 2 km ක් දුරින් වූ කාර්යාලයට යාමට මිනිත්තු 5 ක් ගතවිය. ඔහු ගමන් කළ වේගය පැයට කිලෝමීටර වලින් සොයන්න.

---

22. ABCD ත්‍රපීසියමේ වර්ගඵලය $66\ cm^2$ නම් AD දිග සොයන්න.



---

23. පහත එක් එක් චතුරස්‍රවල දී ඇති තොරතුරු අනුව සමාන්තරාස්‍ර තෝරා යටින් ඉරක් අඳින්න.



(i) (ii) (iii) (iv)

---

24. ABC ත්‍රිකෝණයේ BC පාදය D තෙක් දික්කර ඇත. $B\hat{A}C$ හා $A\hat{B}C$ හි සමච්ඡේදක O හි දී හමුවේ. $A\hat{C}D = 140^0$ නම් $A\hat{O}B$ හි අගය සොයන්න.



---

25. දී ඇති ABC ත්‍රිකෝණයේ A ට හා B ට සමදුරින් AC මත පිහිටන P ලක්ෂ්‍යය සොයා ගැනීමට අවශ්‍ය නිර්මාණ රේඛාවල දළසටහනක් ඇඳ P ලකුණු කරන්න.



Past Papers Wiki

B කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයෙහි ම පිළිතුරු සපයන්න.

01. කාණුවක මුළු දිගෙන් $\frac{3}{7}$ ක් පළමු දිනයේ ද, ඉතිරියෙන් $\frac{5}{8}$ ක් දෙවන දිනයේ ද කපන ලදී.

i) පළමු දිනය අවසානයේ කාණුවෙන් කවර භාගයක් කැපීමට ඉතිරිව තිබේද ?

ii) දෙවන දිනයේ මුළු දිගෙන් කවර භාගයක් කපනු ලැබුවේද ?

iii) දින දෙක අවසානයේ කැපීමට ඉතිරිව ඇති කොටස 15 m ක් නම් කාණුවේ මුළු දිග සොයන්න.

iv) කාණුවේ 5 m ක දුරක් කැපීම සඳහා මිනිස් දින 4 ක් වැය වෙතැයි තක්සේරු කර ඇත්නම් කාණුවේ ඉතිරිව ඇති 15 m දුර දින දෙකකින් කපා නිමකිරීමට දිනකට යෙදවිය යුතු මිනිසුන් ගණන සොයන්න.

---

02. රූපයේ දැක්වෙන්නේ අර්ධ වෘත්ත කොටසකින් හා සෘජුකෝණාස්‍ර කොටසකින් සමන්විත ළමා ක්‍රීඩා පිටියකි.



i) අර්ධ වෘත්ත කොටසේ අරය සොයන්න.

ii) අර්ධ වෘත්ත කොටසේ වර්ගඵලය සොයන්න.

iii) සෘජුකෝණාස්‍ර කොටසේ වර්ගඵලය අර්ධ වෘත්ත කොටසේ වර්ගඵලයට වඩා 7 m^2 ක් වැඩි නම් BC දිග සොයන්න.

iv) ළමා ක්‍රීඩා පිටියේ පරිමිතිය සොයන්න.

03. (a)

වාර්ෂික ආදායම (රු.)	ආදායම් බදු ප්‍රතිශතය
පළමු 1 800 000	නිදහස්
ඊළඟ 600 000	6%
ඊළඟ 600 000	12%

වාර්ෂික ආදායමට අනුව ආදායම් බදු අයකරන ප්‍රතිශතයක් ඉහත වගුවේ දැක්වේ.

වාර්ෂික ආදායම රුපියල් 2 750 000 අයෙකු ආදායම් බද්ද ලෙස වසරකට ගෙවිය යුතු මුදල සොයන්න.

(b) විදුලි උපකරණයක ආනයනික මිලරුපියල් 30 000 කි.

i) එය ආනයනය කිරීමේ දී රුපියල් 3 000 ක තීරු බද්දක් අයකරන ලද නම් අයකළ තීරුබදු ප්‍රතිශතය සොයන්න.

ii) ඉහත උපකරණය ආනයනය කළ තැනැත්තා රුපියල් 7 000 ක ලාභයක් ලැබෙන පරිදි එහි මිල නියම කරයි. ඒ සඳහා 8% ක එකතු කළ අගය මත බද්දක් ද (vat) අයකරනු ලබයි නම් එය මිලදී ගන්නා අයකු ගෙවිය යුතු මුදල සොයන්න.

---

04. (a) 1 සිට 8 තෙක් අංක සටහන් කරන ලද වාසනා චක්‍රය කරකවා ඊ හිස ඉදිරියේ නතරවන අංකය සටහන් කරගැනීමේ සසම්භාවී පරීක්ෂණයේ,



i) S නියැදි අවකාශය ලියන්න.

ii) ප්‍රථමක සංඛ්‍යාවක් ලැබීමේ සිද්ධිය A නම් A කුලකය ලියා දක්වන්න.

iii) ප්‍රථමක සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව එනම් P(A) සොයන්න.

iv) 2 හි ගුණාකාරයක් හෝ 3 හි ගුණාකාරයක් හෝ ලැබීමේ සම්භාවිතාව සොයන්න.

(b) $\varepsilon = \{a, b, c, d, e, f, g\}$

$A = \{b, c, d\}$

$A \cap B = \{c, d\}$

ඉහත තොරතුරු දී ඇති වෙන්රූප සටහනේ ඇතුළත් කරන්න.



05. පාසලක 10 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් 144 කින් සෑම සිසුවෙක්ම සෞන්දර්ය විෂය සඳහා චිත්‍ර, සංගීත, නැටුම් හෝ නාට්‍ය හා රංගකලාව යන විෂයන්ගෙන් එක් විෂයක් පමණක් තෝරාගත යුතුය. සිසුන් එක් එක් විෂය තෝරාගත් ආකාරය වට ප්‍රස්තාරයේ දැක්වේ.



i) සංගීතය හදාරන සිසුන් ගණන මුළු සිසුන් ගණනෙන් කවර භාගයක්ද ?

ii) නැටුම් හදාරන සිසුන් ගණන, සංගීතය හදාරන සිසුන් ගණනට සමාන වන අතර, චිත්‍ර හදාරන සිසුන් ගණන, නාට්‍ය හා රංග කලාව හදාරන සිසුන් ගණන මෙන් තුන්ගුණයකි. නාට්‍ය හා රංගකලාව හදාරන සිසුන් දැක්වෙන කේන්ද්‍ර කෝණය සොයන්න.

iiii) චිත්‍ර විෂය හදාරන සිසුන් ගණන සොයන්න.

iv) මාසයකට පසුව සංගීතය විෂය හදාරනු ලැබූ සිසුන් හතර දෙනෙකු නාට්‍ය හා රංගකලාව විෂයට මාරු වූහ. වෙනස් වූ දත්ත සලකා ඇඳි නව වට ප්‍රස්තාරයක සංගීත විෂයට අදාළ කේන්ද්‍ර කෝණය සොයන්න.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025 / Second Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	ගණිතය - II	කාලය / நேரம் / Time	පැය 3 යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

අමතර කියවීම් කාලය මිනිත්තු 10

වැදගත් :

- ★ **A කොටසින් ප්‍රශ්න පහක් සහ B කොටසින් ප්‍රශ්න පහක් තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.**
- ★ **ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී අදාළ පියවර හා නිවැරදි ඒකක ලියා දක්වන්න.**
- ★ **සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.**

A කොටස

★ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

---

01. නිවසක වාර්ෂික තක්සේරු වටිනාකම රුපියල් 64 000 කි. එම දේපල සඳහා නගර සභාව 8% ක වාර්ෂික වරිපනම් බද්දක් අයකරයි. වසරකට පසු නිවසේ වාර්ෂික තක්සේරු වටිනාකම වෙනස්වූ අතර නගර සභාව අයකල වාර්ෂික වරිපනම් බදු ප්‍රතිශතය ද 9% තෙක් වැඩි විය. එවිට කාර්තුවකට ගෙවිය යුතු වරිපනම් මුදල රුපියල් 340 කින් වැඩිවිය. නිවසේ නව වාර්ෂික තක්සේරු වටිනාකම සොයන්න.

---

02. $y = x^2 - k$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීම සඳහා පිළියෙල කල x හා y හි අගය ඇතුළත් අසම්පූර්ණ වගුවක් පහත දැක්වේ.

x	- 3	- 2	- 1	0	1	2	3
y	5	0	- 3	- 4	- 3	.....	5

(a) i) වගුවේ සමමිතිය සැලකීමෙන් $x = 2$ විට y හි අගය සොයන්න.

ii) x අක්ෂය දිගේත්, y අක්ෂය දිගේත් කුඩා කොටු 10 කින් ඒකක එකක් නිරූපණය වනසේ පරිමාණය ගෙන ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

(b) ඔබේ ප්‍රස්තාරය ඇසුරින්,

i) k හි අගය සොයන්න.

ii) ශ්‍රිතයේ වර්තන ලක්ෂ්‍යයේ බණ්ඩාංක ලියන්න.

iii) ශ්‍රිතයේ අගය ඍණව වැඩිවන x හි අගය පරාසය සොයන්න.

iv) ඉහත ප්‍රස්තාරය y අක්ෂයේ ධන දිශාවට ඒකක 4 ක් විස්ථාපනය කළවිට ලැබෙන ප්‍රස්තාරයේ සමීකරණය ලියන්න.

03. (a) අධ්‍යාපන ප්‍රදර්ශනයක් නැරඹීම සඳහා ළමයින් හා ගුරුවරුන්ගෙන් සමන්විත 49 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගි විය. ප්‍රදර්ශන භූමියට ඇතුල්වීම සඳහා ළමා ප්‍රවේශ පත්‍රයක් රුපියල් 60 ක් ද, වැඩිහිටි ප්‍රවේශ පත්‍රයක් රුපියල් 100 ක් ද වූ අතර ඔවුන් සියළුදෙනාටම ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම සඳහා රුපියල් 3 100 ක් වැය විය.

i) ළමයින් ගණන x ද, ගුරුවරුන් ගණන y ලෙස ද ගෙන ඉහත තොරතුරු ඇසුරින් සමගාමී සමීකරණ යුගලක් ගොඩනගන්න.

ii) සමගාමී සමීකරණ යුගල විසඳා ළමයින් ගණනත්, ගුරුවරුන් ගණනත් වෙන වෙනම සොයන්න.

(b) සුළු කරන්න. $\frac{2}{p+1} + \frac{4}{p^2 - 1}$

---

04. රූපයේ දැක්වෙන A හා B තලරූප දෙක වර්ගඵලයෙන් සමාන වෙයි.

x මගින් $x^2 + 3x - 40 = 0$ වර්ගජ සමීකරණය ලබාදෙන බව පෙන්වා එය විසඳා A සෘජුකෝණාස්‍රයේ දිග හා පළල වෙන වෙනම සොයන්න.



---

05. (a) සුපුන් යතුරුපැදියෙන් A සිට D තෙක් ගමන් කිරීමට අදාල දුර - කාල ප්‍රස්තාරය පහත දැක්වේ.



i) ගමනේ මුළු දුර සොයන්න.

ii) A සිට D තෙක් ගමන් කල මධ්‍යක වේගය සොයන්න.

iii) A සිට B තෙක් ගමන් කල වේගය පැයට කිලෝමීටරවලින් සොයන්න.

iv) A සිට B තෙක් ගමන් කල වේගයෙන්ම මුළු ගමනම ගියේ නම් ගමනට ගතවන කාලය මිනිත්තු කීයකින් අඩුකර ගත හැකිව තිබුනිද ?

(b) 72 kmh^{-1} ඒකාකාර වේගයෙන් ගමන් කරන 120 m දිග දුම්රියකට සංඥා කුළුනක් පසු කිරීමට ගතවන කාලය සොයන්න.

---

06. පොලිස් ස්ථානයක සුළු පැමිණිලි අංශයට දෛනිකව ලැබෙන පැමිණිලි ගණන පිළිබඳව දින 50 ක් තුල ලබාගත් තොරතුරු පහත වගුවේ දැක්වේ.

දිනකට ලැබෙන පැමිණිලි ගණන (x)	දින ගණන (f)	fx
15	4	
16	6	
17	10	
18	15	
19	10	
20	5	
	$\sum f =$	$\sum fx =$

i) මාතය සොයන්න.

ii) දිනකට ලැබෙන මධ්‍යන්‍ය පැමිණිලි ගණන ආසන්න පූර්ණ සංඛ්‍යාවට සොයන්න.

iii) දිනකට ලැබෙන පැමිණිලි සංඛ්‍යාව 18 ට වඩා වැඩියෙන් ලැබුණු දින ගණන මුළු දින ගණනෙහි ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

B කොටස

★ ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

07. ළමයෙක් ගිනිකුරු උදව් කරගනිමින් සකස් කළ රටාවක මුල් පියවර තුන පහත දැක්වේ.



i) පළමු පියවර සෑදීම සඳහා යොදාගත් ගිනිකුරු 4 නම් මුල් පියවර තුන සඳහා අවශ්‍ය ගිනිකුරු සංඛ්‍යා පිළිවෙලින් ලියා දක්වන්න.

ii) රටාවේ පොදුපදය සොයන්න.

iii) 10 වන රටාව සෑදීම සඳහා අවශ්‍ය ගිනිකුරු ගණන සොයන්න.

iv) ගිනිකුරු 51 අවශ්‍ය වනුයේ රටාවේ කීවන පියවර සෑදීම සඳහාද ?

v) ඉහත රටාවේ 9, 10, 11 යන පියවර 3 සෑදීමට අවශ්‍ය මුළු ගිනිකුරු ගණන 100 ට අඩු බව සුපුන් පවසයි. එම ප්‍රකාශය සත්‍යවේද ?

---

08. cm/mm පරිමාණයක් හා කවකටුව භාවිතා කර,

i) $AB = 6\,cm, A\hat{B}C = 120^0, BC = 4\,cm$ වන පරිදි ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

ii) C සිට දික්කරන ලද AB ට ලම්බකයක් නිර්මාණය කරන්න. ලම්බයේ අඩිය D ලෙස නම් කරන්න.

iii) A ට හා D ට සමදුරින් ගමන් කරන ලක්ෂ්‍යයේ පථය නිර්මාණය කර එය AC හමුවන ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න.

iv) O කේන්ද්‍රය වශයෙන් ද OA අරය වශයෙන් ද ගෙන වෘත්තයක් නිර්මාණය කරන්න.

---

09. (a) ලඝුගණක වගු භාවිතයෙන් තොරව අගය සොයන්න.

$\log_{10} 150 + \log_{10} 8 - \log_{10} 12$

(b) විසඳන්න. $\log_a x - \log_{10} 5 = \log_a 36 - \log_a 4$

(c) $P = \dfrac{108 \times a}{3\pi}$ සූත්‍රයේ $a = 5.4$ ද, $3\pi = 9.42$ ද නම් P හි අගය ලඝුගණක වගුව භාවිතයෙන් සොයන්න.

---

10. ABC ත්‍රිකෝණයේ $AC = BC$ වෙයි. $A\hat{B}C$ හා $A\hat{C}D$ කෝණවල සමච්ඡේදක E හිදී හමුවේ. $A\hat{B}E = a^0$ නම්,

(a) පහත එක් එක් කෝණයක් a^0 ඇසුරින් ලියන්න.

i) $B\hat{A}C$ ii) $A\hat{C}D$ iii) $B\hat{E}C$

(b) BCE සමද්විපාද ත්‍රිකෝණයක් බව පෙන්වන්න.

(c) $AB \,//\, CE$ බව පෙන්වන්න.



11. ABC ත්‍රිකෝණයේ AB = AC වේ. BC හි මධ්‍ය ලක්ෂ්‍යය D වේ. CB ට ලම්බකව BE ඇඳ ඇති අතර AB = DE වේ.



i) $ABD\Delta \equiv ACD\Delta$ බව පෙන්වන්න.

ii) $ABD\Delta \equiv BDE\Delta$ බව පෙන්වන්න.

iii) ABED සමාන්තරාස්‍රයක් බව පෙන්වන්න.

---

12. ඉංග්‍රීසි හා සිංහල මාධ්‍ය වලින් පමණක් ඉගැන්වීම සිදුකරන මිශ්‍ර පාසලක 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් පිළිබඳ තොරතුරු ඇතුලත් අසම්පූර්ණ වෙන්රූප සටහන පහත දැක්වේ.



මුළු සිසුන් සංඛ්‍යාව 250 වන අතර ඉන් 110 පිරිමි ළමුන්ය. ඉංග්‍රීසි මාධ්‍ය සිසුන් සංඛ්‍යාව 60 කි.

i) දී ඇති වෙන් රූපසටහනෙහි ඉහත දත්ත ඇතුලත් කරන්න.

ii) වෙන් රූපයේ අඳුරු කළ පෙදෙසින් නිරූපණය වන පිරිස හඳුන්වන්න.

iii) සිංහල මාධ්‍යයෙන් ඉගෙනුම ලබන ගැහැණු ළමුන් ගණන සොයන්න.

iv) ඉංග්‍රීසි මාධ්‍ය ගැහැනු ළමුන් 6 දෙනෙකු හා පිරිමි ළමුන් දෙදෙනෙකු සිංහල මාධ්‍යයට මාරුවිය. ඒ අනුව පහත වෙන්රූප සටහනෙහි එක් එක් පෙදෙසට අයත් අවයව සංඛ්‍යා ලියා දක්වන්න.



දෙවන වන වාර විභාගය - 2025

10 ශ්‍රේණිය ලකුණු ලබාදීමේ පටිපාටිය -

I – A

1) $\frac{6 \times 7}{3} = 14$ (02)
6 x 7 ල. 1

2) $4x^2$ ල. 1
9 ල. 1 (02)

3) $X + 2x + 105^0 = 180^0$ ල. 1
$X = 25^0$ ල. 1 (02)

4) 1200 l (02)

5) $X = 130^0$ (02)

6) X = 6 (02)

7) 6^3 (02)

8) 

(02)

9) X = 6 (02)

10) $4a^2 b^3 c$ (02)

11) CO = OD (02)

12) 20 000 x $\frac{4}{100}$ ල. 1 (02)
රු. 20 800 ල. 1

13) m = 2 ල. 1
y = 2x + 1 ල. 1 (02)

14) 14) 8.5 (02)

15) X= 4 ල. 1
X = -1 ල. 1 (02)

16) $B\hat{A}D = 35^0$ (02)
$B\hat{D}C = 70^0$ ල. 1

17) (2x + 5) (02)

18) 40^0 (02)
$D\hat{A}X = 50^0$ ල. 1

19) 18 (02)
30 x $\frac{3}{5}$ ල. 1

20) CE = 11 cm ල. 1
7 + 10+ 3 + 11 = 31 cm ල. 1 (02)

21) 24 kmh^{-1} (02)

22) $\frac{1}{2}(9 + 13) \times x = 66$ ල. 1
X= 6 cm ල. 1 (02)

23) I , III (02)

24) $2a + 2b = 140^0$ ල. 1
$A\hat{O}B = 110^0$ ල. 1 (02)

25) ලම්භ සම., ලකුණු කිරීම (02)

B කොටස

1)(i) $\frac{4}{7}$ ල.(1)

(ii) $\frac{4}{7} X \frac{5}{8} = \frac{5}{14}$ ල. 1 ,1 ල.(2)

(iii)) $\frac{3}{7} + \frac{5}{14} = \frac{11}{14}$ ල. 1

ඉතිරිය $\frac{3}{14}$, $\frac{3}{14} \longrightarrow$ 15 ල. 1 ,1

70 m ල. 1 ල. (4)

(iv)15m $\longrightarrow$ 12 ල. 1

$\frac{12}{2}$ = 6 ල. 1 ,1 ල.(3)

10

2)(i) $\frac{14X3}{2}$= 21 m ල. 1 ,1 ල.(2)

(ii) $\frac{1}{2} X \frac{22}{7} X21X21$ = 693 ල. 1 ,1 ල.(2)

(iii) $\frac{700}{14} = 50$m ල. 1 ,1 ල.(2)

(iv)) $\frac{1}{2} X\ 2\ X \frac{22}{7} X21$ ල. 1

50+50+14+14+14+66= 208 m ල. 1 ,1 ල.(3)

10

3)(a) (i)180000 ල. 1

600 000X$\frac{6}{100}$ = රු.36 000 ල. 1

350 000 X$\frac{12}{100}$ = රු.42 000 ල. 1

36 000+42 000 = රු.78 000 ල. 1 ල. (4)

(b)(i) $\frac{3000}{30000}X100\% = 10\%$ ල. 1 ,1 ල. (2)

(ii) 30 000+3 000+7 000 = 40 000 ල. 1

40 000X$\frac{8}{100}$ = රු.3200 ල. 1 ,1

40 000+3 200 = 43 200 ල. 1 ල. (4)

10

2)(a)(i) 0 (02)

(ii) නිවැරදි අක්ෂ ල. 1

නිවැරදි ලක්ෂ ල. 1

සුමට වක්‍රය ල. 1 (03)

(b) (i) -4 (01)

(ii) (0,-4) (01)

(iii)0≤x≤2 (02)

(iv)$y=x^2$ (01) 10

4) (a) (i)S ={1,2,3,4,5,6,7,8} ල. (1)

(ii) A = {2,3,5,7} ල. (2)

(iii) P(A) =$\frac{4}{8}=\frac{1}{2}$ ල. (2)

(iv) $\frac{4}{8}=\frac{1}{2}$ ල. (2)

(b)



ල. (3)

10

3)(i)x+y=49 ල. 1

60x+100y=3100 ල. 1 (02)

(ii) y=4 සෙවීමට (02)

x=45 සෙවීමට (01)

ගුරුවරු 4

ළමයි 45 (01)

(b) සාධක දක්වා සුළු කර $\frac{2}{p-1}$ ලබා ගැනීමට (04)

10

5) (i) $\frac{90°}{360°} \longrightarrow \frac{1}{4}$ ල. (2)

(ii) x+3x+90°+90°=360° ල. 1

4 X +180°=360° ල. 1

X = 45° ල. 1 ල. (3)

(iii) 360° $\longrightarrow$ 144

135° $\longrightarrow \frac{144}{360°} X\ 135°$ ල. 1

54° ල. 1 ල. (2)

(iv)144 $\longrightarrow$ 360°

4 $\longrightarrow \frac{360°}{144} X\ 4 = 10°$ ල. 2

45°+10° =55° ල. 1 ල. (3)

10

4) A හි ව.ඵ.=x^2 +3x -4 ල. 1

B හි ව.ඵ. = 36 cm^2 ල. 1

x^2 +3x -4 =36 cm^2 ල. 1

$(x+\frac{3}{2})^2 = \frac{\sqrt{169}}{4}$ ල. 2

X= 5 , x = -8 ල. 2

දිග x=5 ල. 1

දිග = 5+4=9 ල. 1

පළල=5-1=4 ල. 1 10

II කොටස A

1)

64 000X$\frac{8}{100}$X$\frac{1}{4}$ = රු. 1280 ල. 2,1

1280+340 = රු.1620 ල. 2

1620 X 4 = රු.6480 ල.2

6480 X $\frac{100}{9}$ = රු.72 000 ල.3 10

5)(i)16+8+8=32km (01)

(ii)32kmh^{-1} (02)

(iii)$\frac{16km}{\frac{20}{60}}$ ල. 1

16X3 =48kmh^{-1} ල. 1 (02)

(iv)A - B = මිනි.20

B –D= මිනි.20 ල. 1

මුළු කාලය =20+20 =මිනි.40

අඩුවන කාලය =60-40= මිනි.20 ල. 1 (03)

(b)$\frac{3600X120}{72X1000}$ = තත්පර 6 (02) 10

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

6) (i) 18 (01)
(ii)fx තීරුවට ල. 2
$\sum f = 50$ (වගුව) ල. 1
$\sum fx$=886(වගුව) ල. 1
$\frac{\sum fx}{\sum f} = \frac{886}{50}$ = 17.72 ල. 1
18 ල. 1 (06)
(iii)$\frac{15}{50}$ X 100% ල. 2
30% ල. 1 (03) 10

10)(i) $B\hat{A}C$=2a ල. 1
(ii) $A\hat{C}D$ =4a ල. 1
(iii) $B\hat{E}C$=180° -(180° -2a +a) =a° ල. 1 (03)
(b) $A\hat{B}E = C\hat{B}E$ ($A\hat{B}C$ හි සමච්ඡේදකය නිසා) ල.1
$C\hat{B}E = B\hat{E}C$බව පෙන්වීමට ල.1
BC=CE(සමාන කෝණවලට සම්.පාද සමානයි) ල.1,1(04)
(c) $A\hat{B}E = a°$ (දත්තය)
$B\hat{E}C = a°$
$A\hat{B}E = B\hat{E}C$ (ප්‍රත්‍යක්ෂ) ල.1,1
AB || CE (ඒකාන්තර කෝණ සමාන නිසා) ල.1 (03) 10

II කොටස B

7)(i) 4,7,10 (01)
(ii) 4,7,10 ලබා ගැනීම දැක්වීමට ල.1
T_n =3n+1 ල. 1 (02)
T_n =3n+1
T_{10} =3X10 + 1= 31 (02)
(iv)3n+1=52 ල. 1
n =17
17 වන පියවර ල. 1 (02)
(v) T_9 =28
T_{10} =31
T_{11} =34 ල. 1
$T_9 + T_{10} + T_{11} = 93$ ල. 1
93<100 ප්‍රකාශය සත්‍ය වේ. ල. 1 (03) 10

11) i) AB = AC (දත්තය)
BD = DC (D මධ්‍ය ලක්ෂය) ල.1
AD පොදුයි. ල.1
ABDΔ ≡ ACDΔ (පා.පා.පා.) ල.1 (03)
ii) A$\hat{D}B$ = A$\hat{D}C$ (අංගසම Δවල අනුරූප අංග= වේ.)
A$\hat{D}$B + A$\hat{D}$C = 180°(BDC සරල රේඛාව මත පිහිටි කෝණවල එකතුව 180°) ල.1
A$\hat{D}$B = 90°
D$\hat{B}$E = 90° (දත්තය)
AB = DE (දත්තය) ල.1
BD පොදුපාදය ල.1
ABDΔ ≡ BDEΔ (කණ්ඩර් පා. අවස්ථාව) ල.1 (04)
iii) AB = DE (දත්තය) ල. 1
AD = BE (අංගසම Δවල අනුරූප අංග= වේ.) ල. 1 ABED සමාන්තරාශ්‍රයකි. (සම්. පාද යුගල සමාන නිසා)ල.1 (03) 10

8)AB----, 6cm----- ල. 1
$A\hat{B}C$= 120° ල. 1
C------, Δ ල. 1 (03)
(ii)ලම්බකය ල. 2
D------ ල. 1 (03)
(iii) පථය ල. 1
90° සහ සමානතාවයට ල. 1
O------ ල. 1 (03)
(iv)වෘත්තය (01) 10

12) i)



ල. 1x3 = (03)
ii) සිංහල මාධ්‍ය පිරිමි ළමයි. (02)
ii) 250 - (60+86) = 104 ල. 1,1 (02)
iv)



1 x3 (03) 10

9)(a) $log_{10} \frac{150X8}{12}$ ල. 1
Lg 100=2 ල. 1 (02)
(b)$log_a x - log_a 5 = log_a 36 - log_a 4$
$log_a \frac{x}{5} = log_a \frac{36}{4}$ ල.
$\frac{x}{5}$ = 9
X=45 ල. 1 (02)
(b) p=$\frac{108X5.4}{9.42}$
lg P = lg 108 + lg 5.4 –lg 9.42 ල. 1
=2.0334+0.7324-0.9741 ල. 2
=2.7658-0.9741=1.7917 ල. 1
p = antilog 1.7917 ල. 1
p= 61.9 ල. 1 (06) 10